
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 මාර්තු 12 සඳුදා
04 වෙළුම - 20 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය





## ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දේවමාළිගාව පවිත්‍ර කිරීම – ( ජුවාම් 2 : 13 – 15 )

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# පාපයෙන් බැහැර ජීවිතයක් සඳහා...

## (ජීවිතය නැමැති දේව මන්දිරය පවිත්‍ර කරමු)

### ආදරණීය දුවේ පුතේ...

චතාරික සමය ආරම්භ වුවාට පසුව දැන් තුන්වෙනි සතියටත් පා තබනවා. අළු බදාදා දින පටන් අපි ධර්ම විවේකයක් සේ අපගේ කල්පනාව හා මෙනෙහි කිරීම මුලික වශයෙන්ම ඒ ඒ සතියට නියමිත ශුද්ධවූ ලියවිලි පාඨ ඔස්සේ රැගෙන ආවේ සැබවින්ම මේ චතාරික සමය තුළ අපගේ කිතුනු ආධ්‍යාත්මිකත්වයේ පැවැත්ම ගැන ගැඹුරින්ම සිතා ජ්වලිත සිහි ගැන්වීමකටයි.

ආදර දුවේ පුතේ,

දෙවියන් වහන්සේගේ උතුම්ම මැවිල්ල මනුෂ්‍යයායි. නමුත් ජීවත් වන සෑම පරිසරයකම එදා මෙදා තුර අපි දකින්නේ මේ මැවිල්ලෙහි උතුම් බව වටහා නොගෙන මනුෂ්‍යයා සිතූ සිතූ අයුරින් පාපයට ලොල්ව කටයුතු කරන ආකාරයයි.

බලන්න, එදා ඊජිප්තු දේශයේ වහල් බවින් සිටි ජනතාව එම වහල් භාවයෙන් මුදවාගෙන විශාල දයා කරුණාවක් තුළ තමන් වහන්සේටම අවනත ජනතාවක් සේ ගොඩ නැංවීමේ පිවිතිරි අභිලාෂයෙන් දස පනත එම ජනතාවට දෙවියන් වහන්සේ ප්‍රදානය කරන ආකාරය. සැබෑ දේව ප්‍රේමය තුළ මිනිස් ජීවිතය ගොඩ නැංවීමේ තිබෙන උතුම් භාවය මෙතුළින් නිරූපණය කරනවා. නියමිත පණත් වලින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේට ප්‍රසන්න ජීවිතයක් ගත කළ යුත්තේ කෙසේද යන්නයි. නමුත් මනුෂ්‍යයා දෙවියන් වහන්සේට සමීපව සිටින බව පෙන්නුම් කරමින් බොහෝ විට ආත්ම වංචාව තුළ පාපයට නැඹුරු ජීවිතයක් ගත කරන්නට ගන්නා උත්සහය නම් නිරන්තරයෙන්ම දැකිය හැකියි.

ආදර දුවේ පුතේ,

මේ චතාරික සමයේ ඉරුදින දිව්‍ය පූජා වලට නියමිත කියවීම් වලින් මේ කථා පුවත් පැහැදිලිව දිස් කරවනවා.කතෝලික විශ්වාසය තුළ දෙවියන් වහන්සේගේ වචනය තුළ නිමග්න වෙමින් පැහැදිලිව හිතන්නට අපිව යොමු කර වනවා.

ඒ නිසා විශේෂයෙන්ම මේ චතාරික සමයේ තුන් වන සතියට නියමිත සුවිශේෂ පාඨය ගෙන හැර දක්වන කදිම අගනා ජීවිත පාඩම් දෙසට ඔබ අනිවාර්යයෙන්ම සිත් යොමු කරන්නට ඕනා. ඇයි ක්‍රිස්තුන් වහන්සේ දේව මළිගාව පවිත්‍ර කිරීමට එලෙස ක්‍රියා මාර්ග යක් ගන්නේ? ඔබ හොඳින් මෙම සුවිශේෂ පාඨය ගැන හිතන්න අවශ්‍යයි. දෙවියන් වහන්සේට සමීප ස්ථානය කුමක් ද ඒ ස්ථානය පවිත්‍ර විය යුතුයි. මේ දේව මන්දිරය එයට කදිම නිදසුනක් බවට ක්‍රිස්තුන් වහන්සේ පත් කරනවා. ධනය, බලය, ආශාව, තන්හාව, ලොල්බව තුළ කිමිදෙමින් අපට දෙවියන් වහන්සේව අත් දකින්නට බැහැ. අපේ ජීවිතය දේව මන්දිරයයි. ශුද්ධාත්ම වාස බවනයි. එදා කසයක් අතට අරගෙන ක්‍රිස්තුන් වහන්සේ ඒ වෙළඳුන් පන්නා දැම්මා සේ අපේ ජීවිතය ජීවත් කරවන සිත හා ශරීරය තුළින් පාපය, පාපයට ඇලීම, තන්හාවේ ගැලී සිටීම, බලයට ඇති සා පිපාසාව, ධනයට ඇති මත්වීම යනාදිය දහසකුත් එකක් සොරකැල පන්නා දමන්නට නිරන්තරයෙන් තවත් කස ඔවුන් වහන්සේ අතට ගන්නවා.

හැබැයි ආදර දුවේ පුතේ, මේ කස පහර අපට දැනෙන්නේ ආදරයේ ප්‍රේමයේ මිහිරි අත් විඳීමකුත් එක්කයි. ක්‍රිස්තුන් වහන්සේ පුංචි ඔබට හරිම ආදරෙයි. ඒ ආදරය තුළ නිරන්තරයෙන්ම ජීවත් වන ඔබ ඔබේ පුංචි සිත් මාළිගය අපවිත්‍ර කර ගන්න එපා කියලා ඔවුන් වහන්සේ ආයාචනා කරනවා. සමහර විට පුංචි ඔබත් ඔවුන් වහන්සේගේ ඒ හඬ ශබ්දයට ඇහුම්කන් දෙන්නෙ නැතිව වෙනතක් බලාගෙන සිටින්නට පුළුවන්. අපිට එහෙම ජීවත් වෙන්න බැහැ. දුවේ පුතේ, ක්‍රිස්තුන්වහන්සේගේ අති ප්‍රේමණීය දූ දරුවන් හැටියට අපි ඉඩහරින්න ඕනා, ඔවුන් වහන්සේට අපේ සිත, ඇතුලාන්තය ශුද්ධ කරන්නට. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය ඉතාම පැහැදිලියි. ඔවුන් වහන්සේ කියනවා, මාගේ පියාණන් වහන්සේගේ ස්ථානය හොර ගුබ්බෑයමක් කරන්නට ඉඩ දෙන්න බැහැයි කියලා. එහෙම තිප්පොලක් වුනොත් එතකොට පුංචි ඔබේ සිත තුළත් පාපයේ අන්ධකාරය, වෛරයේ ගිනිසිළු, පළිගැනීමේ චේතනා නැමැති ඒ වැඩෙන සොරු ඔබව ඩැහැගන්නවා. ආලෝකයේ ජීවිතයෙන් අන්ධකාරයේ සැඟවුනු ජීවිතයකට තල්ලු කරනවා.

පාපයට ප්‍රිය මනාප අන්ධකාර ජීවිතයයි. නමුත් ආලෝකයේ සමිඳාණන් ඔබව පවිත්‍ර කරන්නේ ආලෝකයේ ජීවිතය අත් දකින්නටයි. ඒ ජීවිතය ජීවත් කරවන්නටයි. මනස්ථාපනය, කමාව ලබා ගැනීම, මර්ධන ක්‍රියා, පුණ්‍ය ක්‍රියා තුළින් ඇති කරවන සිත් හැරීම අපිව ආලෝකයේ දරුවන් කරනවා. ඒ නිසා දෙවියන් වහන්සේට ආදරෙයි කියන ගමන් ඒ ජීවිතය නැමැති දේව මන්දිරය පාපයේ සොරුන්ගේ තිප්පොලක් කරන්නට කවරදාවත් ඉඩ හරින්න එපා. දේව මාලිගය ශුද්ධ පවිත්‍ර කිරීමේ සංකේත ආදර්ශයෙන් ක්‍රිස්තුන් වහන්සේ ඔබෙන් ආයාචනාත්මකව ඉල්ලනදේ කුමක්ද කියලා පුංචි ඔබ වටහා ගන්නට ඕනා. ඒ මතක් කිරීමයි , මම අද ඔබ හමුවේ ඉතාමත්ම ආදරයෙන් තබන්නේ.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# දෙවිඳුන්ට දෙන්න කාලය සොයා ගමු......



ආදර නංගීයේ මල්ලියේ, පුංචි ඔබත් මාත් ගතකරන සෑම තප්පරයක්ම දෙවියන්ට අයිති වෙමු. ඒ ලබා දී ඇති සෑම තප්පරයකම අප කරන්නා වූ සෑම ක්‍රියාවක්ම අපගේ ආශාව, කැමැත්ත උදෙසා නොව දෙවියන්ගේ කැමැත්ත උදෙසා කළ යුත්තෙමු.

මෙලොව ඇති සෑම ලෞකික වස්තූන්ට ආදරය කරන ඔබට මට, මේ උතුම් ජීවිතය ඒ මහ බලගතු දෙවිපියාණන්ට ආදරය කිරීමට ළං වීමට මොහොතක්වත් ගතවන්නේ නැහැ. මුළු දවසේම පාඩම් කටයුතු , බාහිර අභ්‍යාස, විවේකය ගෙදර දොරේ වැඩ කටයුතු සඳහා යොමු වී සිටින ඔබට මට දවසින් එක මොහොතක් දෙවිඳුන්ට පුදන්නට හැකිද?

**නවංජනි තාරිකා ප්‍රනාන්දු**
12 ශ්‍රේණිය (කලා අංශය) - **දංකොටුව බාලිකා මහ විදුහල.**

අන්න එයයි ඔබ මා සිතිය යුත්තේ, බොහෝ විට අපට දකින්නට හැකිවන්නේ දෙවියන්ට වෙන් විය යුතු කාලය රූපවාහිනිය, ක්‍රීඩාවට ලබා දීමයි. මේ නිසා අපගේ ජීවිතයේ දෙවියන්ට හිමි විය යුතු පිදිය යුතු ගෞරවය වන්දනාව දීමට අතපසු වෙනවා. කොතෙක් වස්තුව, දක්ෂතා, තිබුණත් දෙවියන් සමඟ ඇඩි සබඳතාවක් නොමැති නම් එවැනි ජීවිත වතුර නැති කාන්තාරයක් වැනිය. එම නිසා පුංචි ඔබ දෙවියන්ට ඇති ආදරය දක්වන්නාවූ ගෞරවය තව තව වර්ධනය කර ගත යුත්තෙමු. එවිට ඔබට අන් සියල්ලටම වඩා දෙවියන්ගේ ආශිර්වාදය, වරප්‍රසාද, ආදරය, ලැබෙනවා නොඅනුමානය.

# කඳන දිසා ධර්මදූත ළමෝ දුක් ප්‍රාප්තිය සිහි කරති



කඳන දිසා ධර්මදූත ළමා සමාජයේ ළමුන් සඳහා පාදනමස්කාරයක් පසුගිය ද සංවිධානය කෙරිනි. දිසා අධ්‍යක්ෂ ගරු නලින් සුරාජ් පියතුමන්ගේ සංකල්පයකට අනුව මෙය සංවිධානය කෙරෙනි.

මෙහිදි විශේෂත්වයක් වූයේ සියළුම ස්ථානයන් නාට්‍යමය ආකාරයෙන් රඟ දැක්වීමයි. ඒක් ඒක් මීසම් වල ධර්මදූත ළමා සමාජ දරුවෝ එක්ව මෙය රඟදක්වමින් මීට එක් වූහ.

මීසම් 9 ක ධර්මදූත ළමා සමාජ දරුවන් 350 හා සජීවක සජීවිකාවන් 50 ගේ පමණ සහභාගීත්වයෙන් පැවති මෙම පාදනමස්කාරය බටගම ශා. අන්තෝනි මුනිදුන්ගේ දේවස්ථාන භූමියේ දී පැවැත්වුණි.

**අමිල සම්පත්**

# "කෝප වීමට ඉක්මන් නොවන්න. මන්ද, කෝපය සිතේ තබා ගැනීම අනුවණකමකි."



## බයිබලයයි පුංචි මමයි

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන් විසිනි

**ආදර දුවේ පුතේ, මෙවර ද ශු. බයිබලයේ ධර්මදේශකයාගේ පොතෙන් උපුටා ගත් පාඨයක් සමග ඔබ සමග මොහොතක් ගත කිරීමටයි සුදානම් වන්නේ. ධර්මදේශකයාගේ පොතෙහි 7 වන පරිච්ඡේදයේ 9 වන වගන්තිය මෙසේ ප්‍රකාශ කරයි.**

''කෝප වීමට ඉක්මන් නොවන්න. මන්ද, කෝපය සිතේ තබා ගැනීම අනුවණකමකි.''

මිනිසුන් විදියට අපි තුළ යම් යම් අඩුපාඩුකම් තිබුනද ඒවා යම් තරමකට හෝ අඩුකර ගැනීමට මෙලොව ජීවත් වන කාලයේදී උත්සහ ගත යුතුය. මෙලොව පුද්ගලයෙකු වර්ධනය වීමට නම් ඔහු තුළ පවත්නා සම්බන්ධතා හරිම වැදගත්ය. හොඳ මිත්‍රකම් පලුදුවීමට (විනාශ වීමට) අපගේ කෝපය හරියට බලපාන සාධකයකි.

අපි අකමැති දෙයක් තව කෙනෙක් කරන විට අප අසතුටු වෙනවා පමණක් නොව, ඒ පුද්ගලයා සමග තරහ වීමට පවා පෙළඹෙයි. එවැනි කෝපයක් සිතේ තබා ගැනීමෙන් අනිත් අයට වඩා ඔබම දුක් වේවි. අසතුටු වේවි

පුංචි ඔබත් කුඩා කළ සිටම තව කෙනෙක් දිහා කෝපයෙන් බලන්න පුරුදු වන්න එපා. එය හිතේ තබා ගැනීමෙන් පුංචි ඔබේ මල් වන් ලස්සන මුහුණ හා ළමා කම විකෘති වේවි, (කැත වේවි). එවිට ඔබත් අනුවණ හෝ මෝඩ පුද්ගලයෙකු වේවි. ඔබත් බුද්ධිමත්, ආදරවන්ත පුද්ගලයෙකු වීමට කැමති නම් කෝපය වෙනුවට ප්‍රේමය වර්ධනය කරගන්න.

**මාසික සිතිවිල්ල**
**ජයග්‍රාහී නිර්මාණය**



දස මසක් කුසේ සිට මෙලොව
එළිය දුටු මොහොතේ පටන්
තම මව ,පියා
දුක් කම්කටොලු ගොඩක් මැද
උස් මහත් කළ නිසාම
මෙසේ අප පියනගනවා. නොවේද .......
වයස සම්පූර්ණ වූ විගසම
සිප්සතර මනා ලෙස හැදෑරීමට
විදුහලකට ඇතුළුකර
පියගැටපෙළෙන් ටිකෙන් ටික අප
ඉහළට යනවා සේම ........
ඔවුන් අපෙන් බලාපොරොත්තු වන්නේ අපේ
දියුණුවම පමණි !....

**ගයානි නිසංසලා**
**11 ශ්‍රේණිය - දංකොටුව බාලිකා මහා විද්‍යාලය**



**මාසික සිතිවිල්ල**

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

**මාසික සිතිවිල්ල**
"මාර්තු මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.





# අපි ජේසු එක්ක කතා කරමු

**දෙවි පියාණන් වහන්සේ පුදුම ක්‍රියා කරන්නට අපට දී ඇති සැරයටිය ක්‍රිස්තුන් වහන්සෙයි.**

පාරාවෝ වෙතට යාමට මොසෙස් බිය වී දෙවිඳුන්ට මෙසේ කීවේය.

“අනේ මාගේ ස්වාමිනී, කරුණාකර ඔබ කැමති අන් කෙනෙකු යැව්ව මැනව”.



මෝසෙස්ට හාස්කම් පෑමට බලය දී, දෙවිඳුන් හා සම්බන්ධවී සිටියත් පාරාවෝ වෙතට යාමට බිය වුයේ ඇයි? ඊට හේතුව මෙයයි. මෝසෙස් විශ්වාසයේ ඇසින් දෙවිඳුන්ගේ ක්‍රියා දෙස නොබලා තම ශක්තියෙන් පමණක් ක්‍රියා කරන්නට සිතූ බැවින් ඔහු බිය විය.

මොසෙස් අවංකවම තමන්ගේ බිය ප්‍රකාශ කළාය. “ස්වාමිනී , මම කථිකයෙක් නොවෙමි. දිව ගොත ගැහෙන සුළුය.” එලෙසම මෝසෙස් තමන්ගේ දුර්වලකම උන්වහන්සේ ඉදිරියේ පිළිගත්තේ ය. මෝසෙස්ගේ අවංක කම දුටු උන්වහන්සේ ඔහුගේ සහයට ආරෝන් දුන් සේක.

ඔහු (ආරොන්) නුඹ වෙනුවෙන් සෙනඟට කථා කරනු ඇත. මෙසේ ඔහු නුඹේ නියෝජිතයා වන්නේ ය.”

අත්ත මිදි වැලට සම්බන්ධ වන්නා සේ ඔබත් ජේසු සමඟ පුද්ගලිකව සම්බන්ධ වී ජීවත් වන්නේ නම් උන්වහන්සේ ඔබගේ සහයට පැමිණෙනු ඇත. ඔබත් මෝසෙස් මෙන් ඔබගේ නොහැකියාව, දුර්වලකම්, පාපි බව නොසඟවා අවංකව හා විවෘතව ජේසු සමඟ කථා කළ හැක.

ආදර දුවේ පුතේ, දැන් අපි පුංචි අභ්‍යාසයක් කරමු. මේ සඳහා නිශ්චල ස්ථානයක් තෝරා ගන්න ජේසුගේ පිංතූරයක් ඔබ ඉදිරිපිට තියා ගන්න. ජේසු සමඟ සංවාදයේ යෙදෙන්න. යාළුවකු සමඟ කතා කරන්නා සේ ජේසු සමඟ සම්බන්ධ වන්න. උන්වහන්සේටත් සවන් දෙන්න. සිත එකලස් කර ගන්න. අපහසු වුවාට කමක් නැත.

නැවත ජේසුගේ පිංතූරය වෙතට අවදානය යොමු කරන්න.

මෙම අභ්‍යාසය නිතරම කරන්න. එවිට ඔබගේ සහයට ජේසු ළඟා වන හැටි ඔබට ම අත්දැකීමක් කර ගන්න පුළුවන් වේවි.



අගරදගුරු පදවි ළමා දිනය පසුගිය දා තේවත්ත ලංකා අප ස්වාමිදුගේ බැසිලිකා පුදබිමේදී අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. ''වචනයේ දාසියයි ඔබ , මරි මවේ දරු අපේ'' යන තේමාව යටතේ අගරදගුරු පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් ළමා දිනය සංවිධානය කර තිබුණි. මෙදින පැවති ඉඟි නළුව විශේෂාංගය ප්‍රවීන කිතුනු රංගන ශිල්පිනී නීටා ප්‍රනාන්දු සහ රංගන ශිල්පි රිචඩ් මානමුදලි හා දරු කැල එක්ව ඉදිරිපත් කළ අයුරු. **සේයා : රෝෂාන් ප්‍රදීප්**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව ජීවත් කළ මුල් කිතුනු සභාව හඳුනාගනිමු.

**සාමන්‍ය පෙළ විභාගය සඳහා පමණක් නොව පොදුවේ කිතුනු ජීවිතය මල් ඵල ගන්වා ගනු වස් "ජේසුස් " නමැති චරිත ජීවිත් කළ මුල් ජනතාව පිළිබඳව සොයා බැලීම ඉතා යෝග්‍ය වුවකි.**

**ජේසුස් වහන්සේගේ අනුගාමීකයන්ට "කිතුනුවන්" (ක්‍රිස්තියානින්) යන නාමය පළමුවරට භාවිත කරනු ලැබුවේ අන්තියෝකයේදීය. ජේසුස් වහන්සේගේ අනුගාමීකයන්ට "කිතුනුවන්" යනුවෙන් හඳුනාගැනීමට හේතු සාධක වු, ඔවුන් මෙහෙය වු ජවසම්පන්න අත්දැකීම වුයේ, පෙන්තකොස්ත අත්දැකීමයි. එම අත්දැකිම තුළ අද දින අපි පාඩම් ඉදිරියට ගෙන යමු.**

⋆ පෙන්තකොස්ත මංගල්‍යය යනු කුමක් ද?.

පුරාණ ගිවිසුමේ පෙන්තකොස්ත මංගල්‍යය

- මැයි මස 20 වෙනි දිනට ආසන්නව පැවැත්වෙන මෙම මංගල්‍යයෙහිදී ජුදෙව් සෙනඟ ධාන්‍ය අස්වැන්න පිදීම සිදුකරන ලදී. (නික්මයාම 23/16,34/22)
- පෙන්තකොස්ත යන වදනය ''පනස් වන'' යන අර්ථය ගෙන දෙයි.
- ඊශ්‍රායෙල් ජනතාව වර්ෂයක් පාසා වූ, මහා මංගල්‍ය තුන අතරෙන් මෙය එකකි.
- ධාන්‍ය පළමුවෙන් නෙළාගත් දින සිට දවස් 50 කට පසු, පෙන්තකොස්ත මංගල්‍යය පැවැත්විණි. එම දිනයෙහිදී ම දෙවියන් වහන්සේ ඔවුනට ව්‍යවස්ථාවලිය ප්‍රදානය කිරීම ද ඔවුහු සිහිපත් කළහ.
- පෙන්තකොස්ත මංගල්‍යයට සෑම ජුදෙව් පිරිමියකුගේම පැමිණීම, අවශ්‍ය ලෙස සැලකූ බැවින් ද, මංගල්‍යය පැවැත්වු කාලය, ගමන් පහසුවට හිතකර වු බැවින් ද, වන්දනාකරුවන් බොහෝ දෙනෙකු ඊට සහභාගී වීම පිණිස අවුරුදු පතා ජෙරුසලමට පැමිණියහ.

නව ගිවිසුමේ පෙන්තකොස්ත මංගල්‍යය

- ස්වාමින් වහන්සේ ස්වර්ගාරෝහණයෙන් පසු අපෝස්තුළුවරු සේනාකුළු ශාලාවේ දින 09 ක් යාච්ඤා කරමින් ගත කළහ. දසවෙනි දින පෙනතකොස්ත මංගල්‍යය දිනයයි.
- සැඩ සුළඟක් හමන්නාක් මෙන් හඬක් හදිසියෙන් පැමිණිනි.
- අපෝස්තුළුවරු රැස්ව සිටි තැන මුළුමනින්ම එයින් පිරී ගියේ ය.
- ගිනිදළු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටනු පෙනිණි.
- මෙලෙස අපෝස්තුළුවරු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වු මේ දිනය නව ගිවිසුමේ පෙන්තකොස්ත මංගල්‍යයි.

⋆ **පෙන්තකොස්ත මංගල්‍යය දින ශුද්ධාත්මයාණන් ප්‍රකාශ වු සලකුණු දෙකක් නම් කරන්න. (ක්‍රියා 2/1-4)**

- සැඩ සුළඟක් - හෙබ්‍රෙව් සහ ග්‍රීක භාෂාවල සුළඟ සඳහා යෙදෙන වචනයෙහි, ''ආත්මය'' හෝ ''හුස්ම '' යන අර්ථය ද ගැබ් වී ඇත.

  ශුද්ධ ලියවිල්ලෙහි ''සුළඟ'' යන වචනය, ''ජීවනය'' හා ''දෙවියන් වහන්සේගේ බලය හා වැඩ සිටීම '' සංකේතවත් කිරීමට යොදා තිබේ. (නික්මයාම 3/2,19/18 , එසකියෙල් 1/13)

- ගිනිදළු වැනි දිව් - ගින්න දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් කරයි. (නික්මයාම 3/2,19/18, එසකියෙල් 1/13)

**ශුද්ධාත්මයාණන් පැමිණ කල ලෝකය නවතාවයකට පත්වෙයි. ඒ නිසාම "ශුද්ධාත්මයාණන් " යනු "සත්‍යතාවේ ආත්මයාණෝ" යනුවෙන් අපි හඳුන්වමු.**

⋆ ශුද්ධාත්මයාණන් පැමිණි කළ ලෝකයාට වටහා දෙන්නේ කුමක් පිළිබඳව ද? ( ජොහාන් 16/4-11)

- පාපය - ක්‍රිස්තුන් වහන්සේ නොඇදහීම
- විනිශ්චය - මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කිරීම
- ධර්මිෂ්ඨකම - ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේ වෙතට යාම

**බොරුවෙන් කාලය ගත කළ ජනතාවට ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කල සම්පූර්ණ සත්‍යය කරා යාමට මඟ පෙන්වීමක් කරනු ලබයි.**

★ **ශුද්ධාතාමයාණන් තුළ ජීව ගැන්වූ මුල් කිතුනු සභාවේ පැවති ආධ්‍යාත්මික ලක්ෂණ කවරේද?**

- ඉගැන්වීමෙහි ද, සහභාගීකමෙහි ද, රොටි කැඩීමෙහි ද, යාච්ඤාවෙහි ද නිරතවීම
- අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම පිළිගෙන ඒ අනුව ජීවිතය සකස් කරගැනීම
- සැමදෙනාම සැමදේම පොදුවේ තබාගැනීම තමන් සතු දෙයින් කිසිවක් තමාගේම යැයි කිසිවෙක් නොකීම
- ඉඩකඩම් දේපොල විකුණා එකිනෙකාගේ අවශ්‍යතාවයේ හැටියට සියලුදෙනා අතර බෙදා හදා ගැනීම.
- නොකඩවා දිනපතා දේව මාළිගාවේ රැස්වීම
- ගෙයින් ගෙට ගොස් රොටී කැඩීම
- තමන් සතු දේ අන් අය සමඟ බෙදා හදා ගැනීම.
- ප්‍රීතියෙන් හා ත්‍යාගවන්ත සිතින් ආහාර බෙදාගැනීම

★ **ශුද්ධාත්මයාණන් වහන්සේ මෙහෙයවීමෙන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ජීවිතය වැළඳගත් සුවිශේෂ චරිත බොහෝය. ඒ චරිත අතරින් අපගේ විෂය සීමාවට අදාළව කිහිප දෙනෙක් හඳුනාගනිමු.**

1. මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා 2. කල්කයාවේ තෙරේසා මව්තුමිය 3. දෙවන ජුවනාම් පාවුළු සුදතුම් පියා.

★ **මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියාකාරි වූ අන්දම විස්තර කරන්න.**

- සාධාරණත්වය, සත්‍යය වෙනුවෙන් තම ලේඛන හැකියාව යොදාගැනීම හා ඒ වෙනුවෙන් ජර්මන් වධකාගාරයේ සිරකරුවකු වීම
- ප්‍රැන්සිස් නමැති මරණයට නියමව සිටි සිරකරුවෙක් වෙනුවෙන් ජීවිතය පරදුවට තැබීමට එඩිතර වීම (අන් අයගේ වේදනාවට සංවේදී වෙමින් තමන්ව පරිත්‍යාග කිරීම)
- අන් අයගේ තර්ජනවලට නොබියව මුහුණදීම
- යාච්ඤාව හා පශ්චාත්තාපික ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග තුරන් කිරීමට කටයුතු කිරීම

★ **කල්කටාවේ තෙරේසා මව්තුමිය කරන ලද සේවය කුමක් ද?**

- රෝගී දුගී අසරණ අනාථ ළමුන්ට සේවය කරන මධ්‍යස්ථානයක් බවට කල්කටාව පත් කිරීම
- ඒඩ්ස් වැනි භයනක රෝගීන් බලාගැනීමට ඉදිරිපත් වීම
- මරණාසන්නව පාරේ වැටී සිටින මනුෂ්‍යයකුට මැරෙන්නට හැකි හිතකාමී පරිසරයක් ගොඩනගාදීම
- දයාවේ ධර්මදූතින නිකාය ( *Missionary of Charity* )

★ **දෙවන ජුවාම් පාවුළුසුදතුම් පියාගේ ජීවිතයේ දක්නට ලැබෙන දේව ගුණාංග අතරින් ඔබ වඩාත් සිත්ගත් සිද්ධියක් නම් කරන්න**

- 1991 මැයි 13 වෙනි දින රෝමයේ ශාන්ත පීතර චතුරස්‍රයේදී මෙහෙමඩ් අලි අග්කා විසින් දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියාට පිස්තෝලයකින් වෙඩි තබන ලදී.
- එහෙත් ජීවිතය ගලවා ගත් සුදතුම් පියා පසුව සිර කුටියට ගොස් මෙහෙමඩ් අලිඅග්කාට සමාව ලබාදීම : ''පියාණෙනි ඔවුන්ට කමාවුව මැනව. ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති'' (ලූක් 23/34)
- කතෝලික සභාව ගැලීලියෝ ගැලීලිට එරෙහිව කළ වරදට දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියා ප්‍රසිද්ධියේ සමාව ඉල්ලීම 1992 ඔක්තෝබර් 31

★ **දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියාගේ ජීවිතයේ අගය කළයුතු කරුණු තුනක් නම් කරන්න.**

- සභාව විසින් අතීතයේ කරන ලද වැරදිවලට සමාව ඉල්ලීම
- සතුරාට පවා ප්‍රසිද්ධියේ සමාව දීමට එඩිතර වීම
- සියලු බාධක තුළ තම වගකීම් නොපිරිහෙලා ඉටු කිරීම
- දුගී රටවල් ණය බරින් නිදහස් කරන ලෙස ධනවත් රටවලින් ඉල්ලීම

**ඉදිරිපත් කිරීම ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

**මේ උදවී ඇත්තේ චතරික කාලයයි. කතෝලිකයන් ලෙස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛප්‍රාප්තියට සුදනම් වන චතාරික කාලයේ සිදුකරන විවිධ භක්ති අභ්‍යාසයන් අතර පාදනමස්කාරයට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කල්වාරි ගමනේ සුවිශේෂ ස්ථාන තේමාකරගනිමින් සැකසුණු පාදනමස්කාර භක්ති අභ්‍යාසයේ අතීතය මුල් යුගය දක්වා අදටත් දිව යයි.**



# පාදනමස්කාර

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මරණයට තීන්දු කිරීමේ සිට කපාල කන්ද දක්වා රැගෙන ගිය දුක්ප්‍රාප්ති මඟ පිහිටා ඇත්තේ ජෙරුසලමේය. Way To Dolarosa මැයෙන් හැඳින්වෙන දුක්ප්‍රාප්තියේ මඟ ලෙස දැක්වෙන මේ මගේ යමින් යැදුම් ඔප්පු කිරීම, ගීතිකා ගැයීම ආදි විවිධ පිළිවෙත් ඉටුකරන්නට මුල් කිතුනුවෝ පුරුදු පුහුණු වූහ.

ස්වාමින් වහන්සේගේ උත්ථානයෙන් පසු එතුමන්ගේ මෑණියන් ශ්‍රාවකයන් සමගින් ස්වාමින් වහන්සේගේ දුක්ප්‍රාප්ති මඟ ඔස්සේ ගිය බව පැවසේ. පසු කාලයේදී ලෝකයේ විවිධ රටවලින් කිතුනු පිරිස් මේ කරා ඇදී එන්නට වූ නමුත් ඇති වූ විවිධ විදෙස් ආධිපත්‍යයන් හා ඉස්ලාම් තර්ජන හේතුවෙන් ඒ කටයුතු නිදහසේ ඉෂ්ඨ සිද්ධ කරගැනීම අසීරු විය. එහෙත් ඉන් පසු නොබෝ ක්‍රිස්තු දුඃඛප්‍රාප්තියේ ස්ථාන යුරෝපයේ රටවල ඉදිකිරීමට පියවර ගැනිණ.



එහිලා ඉතාලියේ බොලොඤ්ඤා පදවියේ රදගුරු අතිඋතුම් පෙට්‍රියොනියස් (දැන් සාන්තුවර) හිමි දැඩි උනන්දුවක් දැක්විය. එහි සාන්ත ස්තෙෆාන් මුනි දෙව්මැදුරේදී ලෝකයේ මුල්වරට පාද නමස්කාර ස්ථාන ඉදි කැරිණ. මෙය හෙරුසෙලෙම් ලෙස ප්‍රචලිත විය.

දොලොස්වන මෙන්ම තොලොස්වන සියවස් වලදී මේ පිළිවෙත පලස්තීනයෙන් පිටත ජනප්‍රිය වීම නිසා ජෙරුසලමේ කපාල කන්ද වෙනුවට විවිධ ප්‍රදේශවල කල්වාරි කඳු ඉදිවිය.

වර්ෂ 1342 දී ප්‍රැන්සිස්කාන තාපස නිකාය ශුද්ධවූ දේශයේ පාලන කටයුතු තමන් යටතට ගත්තේය. අසීසියේ සාන්ත ප්‍රැන්සිස් මුනිඳුන්ද මේ කටයුතුවලදී දැඩි උනන්දුවකින් හා උද්යෝගයකින් යුතුවීම නිසා ලොවපුරා පාදනමස්කාර භක්ති අභ්‍යාසය පැතිර ගියේය.

15 වන සියවසේ මැදභාගයේදී ඉංග්‍රීසි ජාතික විලියම් වේ නමැති වන්දනා කරුවා ශුද්ධවූ දේශයේ චාරිකා කළ සමයේ පාදනමස්කාර ස්ථාන තිහක් තිබූ බව වාර්තා විය. අති උත්තම එකොලොස්වන ඉනසන්ට් ශුද්ධෝත්තම පියතුමා 1686 දී පාදනමස්කාර ස්ථාන පිහිටුවීමේ බලය ප්‍රැන්සිස්කාන නිකායිකයට ලබාදුන් අතර 1731 දී අති උත්තම දෙලොස්වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා සියලුම දේවස්ථාන වල පාදනමස්කාර ස්ථාන පිහිටුවීමේ අවසරය දනය කළේය. මේ කාලයේ දීම පාදනමස්කාරයේ ස්ථාන 14 ක් විය යුතු යැයි සභා නියමය ක්‍රියාත්මක කළේය. වර්ෂ 1857 වනවිට එංගලන්තයේ රදගුරු හිමිපාණන්ට තමුන්ගේම පාදනමස්කාර ස්ථාන ඉදිකිරීමට ලබය

කිතුනු උරුමය



# ...යේ පුරාවත

ලැබුනු අතර 1862 දී එය ලොව පුරා වෙසෙන සියලු රදගුරු හිමිපාණන්ට ප්‍රදානය කැරිණ.

මුලින්ම පාදනමස්කාරයට අයත් වුයේ ස්ථාන හතක් පමණි. ජේසුස් වහන්සේ කරපිට කුරුසිය තැබීම, පළමුවර බිම වැටීම, සමිඳුණන්ට සිය මෑණියන් සම්මුඛ වීම, වෙරොනිකා සමිඳුන්ගේ ශ්‍රී මුහුණ පිස දැමීම, දෙවන වර බිම වැටීම, කුරුස ගසේ උකුත් වීම හා සොහොන් ගෙයි තැන්පත් කිරීම එම ස්ථාන හත වේ.

පසු කලෙක ස්ථාන 14 ක්වු පාදනමස්කාරයේ එකී ස්ථාන මෙසේය. ජේසුස් වහන්සේ මරණයට තීන්දු කිරීම, කරමත කුරුසිය තැබීම , පළමු වර බිම වැටීම, මෑණියන් සම්මුඛ වීම, සීමොන් සිරිනේවුස් සහයට පැමිණීම, වෙරෝනිකා නම් ස්ත්‍රිය රෙදිකඩකින් ශ්‍රී මුහුණ පිස දැමීම, දෙවන වර බිම වැටීම, ජෙරුසලෙම් ස්ත්‍රීන් හමුවීම, තෙවන වර බිම වැටීම, උන්වහන්සේගේ ඇඳුම් ගලවා දැමීම, කුරුසියේ ඇණ ගැසීම, කුරුසිය මත උකුත්වීම, ශ්‍රී සිරුර කුරුසියෙන් බිමට ගැනීම, සොහොන් ගෙයි තැන්පත් කිරීම යන ස්ථාන 14 ඊට අයත්වේ. මෙය සාම්ප්‍රදායික පාද නමස්කාර පිළිවෙත ලෙස සැලකෙන අතර පසුකලෙක ආධ්‍යාත්මික පාදනමස්කාර ස්ථාන ගැනද සඳහන් විය.


ස්වර්ගස්ථ වී වදාළ අති උත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා දෙදහසේ ක්‍රිස්තු ජයන්තිය නිමිත්තෙන් මේ සුවිශේෂ පාදනමස්කාරය එක්තරා අන්දමක භාවනාත්මක මෙහෙයක් ලෙස නවීකරණය කරමින් එතුමන්ම සකස්කළ බවක් දක්නට ලැබිණ. ඒ අනුව අධ්‍යාත්මික පාද නමස්කරය ලෙස නම් කර 1991 සිට පවත්වාගෙන ආ මහ සිතුරාද පාදනමස්කාරයට අති උතුම් සොලොස්වන පෙනඩික් සසුන්පිය අවසරයද ලැබිණ. එහි ස්ථාන 14 මෙසේය.

ගෙත්සෙමනි උද්‍යානයේ ජේසුස් වහන්සේ යාච්ඤා කිරීම, ජුදස්විසින් සිප ගනිමින් පාවාදීම හා අත් අඩංගුවට පත්වීම, ස්වාමින් වහන්සේව ප්‍රතික්ෂප කිරීම, පේදුරු විසින් නාදුනන බව පැවසීම, පිලාත්තු හමුවේ නඩු විභාගය, කටු ඔටුන්නක් පැළඳ වීම, කුරුසිය කරමත තැබීම, සීමොන් සිරිනේවුස් කුරුසිය රැගෙන යාමට සහය වීම, ජෙරුසලම් ස්ත්‍රීන් හමු වීම, කුරුසියේ ඇණ ගැසීම, යහපත් සොරාට ස්වර්ගීය සම්පත සහතික කිරීම, මරිය තුමිය හා ජුවාම් තුමාට එකිනෙකාට බාරදීම, කුරුසිය මත උකුත්වීම, සොහොන් ගෙයි තැන්පත් කිරීම, ආධ්‍යාත්මික පාදනමස්කාරයේ ස්ථාන 14කි

පාදනමස්කාර භක්ති අභ්‍යාසය සෑම මහ සිකුරාද දිනක රෝමයේ කොලෝසියමේ ප්‍රසිද්ධ මහජන ජනවන්දනා පිළිවෙතක් බවට අතිඋතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා පත්කළ අතර පසුකලෙක ශාරීරික දුබලතා නිසා එතුමන් සහභාගී නොවුවද මුල් කාලයේ කුරුසිය රැගෙන ගමන් කළ අයුරු දැකගත හැකි විය. මීසම්, පාසල්, දෙව්මැදුරු මට්ටමින් පාදනමස්කාර භක්ති අභ්‍යාසය චතාරික සමයේ අද මෙන් හෙටත් සිදුවනු දැක ගත හැකිය. මේ අවස්ථාවලදී පාදනමස්කාරයේ පුරාවත දන්නා දුවා දරුවන් ලෙස වෙනදට වඩා මහත් භක්තියකින් හා ජ්වලිත භාවයකින් යුතුව ඊට සහභාගි වීමට හැකිවනු ඇත.

ශිරාන් මෛත්‍රි

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ)
# සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 46**

දැන් අපි ඉංග්‍රීසි භාෂාවේදී නිතර භාවිතා වන තවත් යෙදුම් කීපයක් ගැන දැනුවත් වෙමු.

<u>**Both** (බෝත්) **/ Neither** (නයිදර්) සහ **Either** (අයිදර්) යන වචන අඩංගු යෙදුම් ගැන අපි කතා කරමු.</u>

Both - කියන්නෙ දෙකම / දෙන්නම යන අදහස

Neither - කියන්නෙ දෙදෙනකුගෙන් හෝ දේවල් දෙකකින් "දෙකම නෑ" යන සාමාන්‍ය අදහස.

Either - (අයිදර්) කියන්නෙ යම් කිසි දේවල් දෙකකින් හෝ දෙදෙනෙක් අතරින් එක්කො එයා/ඒක - නැත්නම් අනිත් කෙනා, අනිත් එක යන අදහස.

අපි බලමු ඒ වචන වාක්‍ය වලදී භාවිතාවෙන්නේ කොහොමද කියල.

<u>**Both**</u>

<u>**Both cars**</u> are expensive. - (බෝත් කා(ර්)ස් ආ(ර්) එක්ස්පෙන්සිව්)

කාර් දෙකම හරි ගනං

<u>Both hotels</u> are very clean. - (බෝත් හොටෙල්ස් ආ(ර්) වෙරි ක්ලීන්)

හොටල් දෙකම හරිම පිරිසිදුයි.

<u>Both books</u> are interesting. - (පොත් දෙකම රසවත්)

Both යන වචනෙ ඉහත විදිහට වැකියක් යෙදුවම ඕනෑම දේවල් දෙකක් පිළිබඳව "දෙකම" යන අදහස පිළිඹුවෙනවා. "Both of" යනුවෙනුත් යෙදෙන අවස්ථා තියෙනවා. නමුත් both කියන වචනය of සමග යෙදුනොත් අනිවාර්යයෙන්ම ඊට පිටුපසින් යෙදෙන වචන ගැන ප්‍රවේසම් විය යුතුයි.

Both of cars are expensive. කියන්න බෑ වැරදියි.

Both cars are expensive. (නිවැරදියි)

Both of pencils කියන්න බෑ (වැරදියි)

Both of **<u>the</u>** pencils විය යුතුයි.

Both pencils are short (නිවැරදියි)

Both of pencils are short (වැරදියි)

Both of the pencils are short (නිවැරදියි)

Both of the hotels are clean (නිවැරදියි)

Both hotels are clean. (නිවැරදියි)

Both of hotels are clean. (වැරදියි)

Both of these books are interesting. (නිවැරදියි)

(මේ පොත් දෙකම රසවත්)

Both of those houses are mine. (නිවැරදියි) (මේ ගෙවල් දෙකම මගේ)

Both of houses are mine. කියන්න බෑ වැරදියි

Both of them are nice boys.

ඔවුන් දෙන්නම හොඳ පිරිමි ළමයි (නිවැරදියි)

Both them are nice boys. (වැරදියි)

Both of my parents are very kind.

මගෙ මව්පියො දෙන්නම හරි කරුණාවන්තයි

Both my parents are kind. (නිවැරදියි)

Both of us are Srilankans. අපි දෙන්නම ශ්‍රී ලාංකිකයෝ

Both of them are Catholics. ඔවුන් දෙදෙනාම කතෝලිකයෝ

Both of those books are his. අර පොත් දෙකම ඔහුගෙ.

Both of your eyes are red. ඔබේ ඇස්දෙකම රතුයි.

There are two shirts. කමිස දෙකක් තියෙනවා.

I like both of them. මම ඒ දෙකටම කැමතියි.

I like both them. (වැරදියි)

I like both shirts. (නිවැරදියි)

Both of us were tired. අපි දෙන්නටම හරි මහන්සියි.

**Both us** කියන්න බෑ වැරදියි.

I liked both films.

I liked both of the films.

I liked both of films


Both Kamala & Rani were late. කමලයි රාණියි දෙන්නම ප්‍රමාදයි.

I was both tired and hungry. මට මහන්සියි වගේම බඩගින්නේ හිටියේ (තත්වයන් දෙකම)

# මහෝපදේශය

කතෝලික ධර්මය පිළිබඳ දැනගත යුතු යම් යම් ගැටළු සහගත තත්වයන් සමහන් කර සරල සුගම බසින් ලියැවී ඇති මහෝපදේශය ග්‍රන්ථය මෙරට කතෝලික සංඝයේ කාලීන අවශ්‍යතාවයක් සපුරාලීමක් ලෙස සැලකිය හැකිය. ශුද්ධවූ සභා ජීවිතයේ අත්‍යවශ්‍යම අංගයක් ලෙස ගිනිය යුතු ධර්මෝපදේශය රටේ පාරිසරික අවශ්‍යතාවන්ය අනුරූප ලෙස හැඩ ගැසෙන වකවානුවක ආගම දහම ඉගැන්වීම පාසලේ සතියටම කාල පරිච්ඡේදයකට හෝ කිහිපයකට සීමාවීම නිසා දහම් හැදියාව ළමා පරපු-රෙන් දුරුවෙමින් පවතී. කතෝලික ගුරු හිගය හේතුවෙන් රටේ රජයේ පාසල් බොහොමයක කිතු දහම හැදෑරීම වෙනුවට බෞද්ධ ධර්මය හැදෑරීමට කතෝලික දු දරුවන්ට බලකරනු ලබන කලවකවානුවක කතෝලික දු දරු පරපුරේ ධර්මෝපදේශ දැනුම නංවාලීමට මහෝපදේශය කදිම අත්වැලක් සපයයි.

විශේෂයෙන් කිතුදහම හඳුන්වාදීමේ විස්තර සටහනේ පටන් පුරා පිටු 298 ක් පැතිර ඇති ග්‍රන්ථයේ දහම් ගඟුල නොකඩවා ගලායන අයුරු විස්මිතය.







ධර්මය ඉතා ගැඹුරු නිසා එය ඉගැන්වීමේ ක්‍රියාවලියද ඉතා ගැඹුරු සංකීර්ණ බවක් ගත හැකි බව සත්‍යයකි. එහෙත් එවන් ගැඹුරු හා සංකීර්ණ බවකින් ධර්මය අවබෝධ කර දිය හැකි වන්නේ සීමිත - උගත් - නැණවත් -දහම හදුරණ පිරිසකට පමණක් විය හැකිය. අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් සිය මහෝපදේශය ග්‍රන්ථය ඉදිරිපත් කරනුයේ ඒ මගින් බැහැර යමින් ඉතා සරල ප්‍රශ්න හා උත්තර පිළිවෙතක් ඔස්සේ ය.

මුලින්ම බොහෝ සංවාදත්මක ප්‍රශ්නය ද - ඊළඟට ඊට අදාළ පිළිතුරුද සපයන ලේඛක හිමිපාණෝ ඉන් නතර නොවී මේ පිළිතුරු සනාථ කරන දේව වදන් ඒ හා සමඟ පලකරනුයේ පාඨකයාට ඉතා පැහැදිලි චිත්‍රයක් මවා ගැනීමට රුකුල් දෙයි සමහර අවස්ථාවල කෙටි විස්තර කර දීමක් තුළින් වඩාත් පුළුල් හා ගැඹුරු අන්තයන් කරා පාඨකයා රැගෙන යන්ෙ-න් ඔහුට වත් නොදැනෙන පරිදිය.

මේ ලිඛිත රටාව ඉතා කුඩා දරු දැරියනට පවා තේරුම් ගත හැකි සරල හා සුමග රටාවකින් සම්පාදනය වී තිබීම නිසා පොඩිත්තන්ට කරුණු කාරණා පැහැදිලි කරදීම ඉතා පහසුවී ඇත. විශේෂයෙන් පාසලේ ඒ ඒ ශ්‍රේණියට අදාළ ආගම විෂය ධාරාව අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන ළමුන් පමණක් ඉලක්ක කරගෙන සකස්වන හෙයින් එමගින් පොදු දැනුමක් ලබා ගැනීම උගහට බැව් අමුතුවෙන් කිව යුතු නොවේ. මහෝපදේශය ඒ ඌනතා මඟ හැර පොදු දහම් දැනුම කොයි කාටත් ලබා දීමට සමත් වීම සුවිශේෂී ලක්ෂණයකයකි.

සමස්ථ ග්‍රන්ථය කොටස් හතරකට බෙදූ ඇති අතර පළමු කොටසින් මූලික සත්‍යතා හඳුන්වා දෙයි. දෙවැනි කොටසින් ප්‍රසාද නිධාන සහ යාච්ඤා ද , තුන්වැනි කොටසින් දේව පනත් සහ සුචරිතය ද , සිවුවැනි කොටසින් මරණයෙන් පසු ජීවිතයද ඉදිරිපත් කරයි. මහෝපදේශය මේ වන විට මුද්‍රණ හතක් නිකුත් වී ඇති අතර එහි ජනප්‍රියතාවයට හා වටිනාකමට එය නිහඬ නිදසුනකි.

**මෛත්‍රී**



**ශු.අග්‍රදූත මිඛායෙල් මුනිතුමා.**
ක්‍රිශේන් දෙව්දුන් ප්‍රනාන්දු
07 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් විදුහල - මොරටුව




**අපේ පල්ලිය**
මරියා සිහින්දී
05 ශ්‍රේණිය
ශා. මරියා ප්‍රාථමික බාලිකා විදුහල - හලාවත



**මරිය තුමිය**
විශ්මිකා සංදිපනී
04 ශ්‍රේණිය
ශු. පවුලේ බාලිකා ප්‍රාථමික විදුහල
මාරවිල



**තාරාවෝ රංචුවක්**
ප්‍රශංසා රේඛානි ප්‍රනාන්දු
07 ශ්‍රේණිය
ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ දහම් පාසල
දඹදුරය (සීදුව මීසම)



**පූපය සහ මිදිරස**
රිද්මි සංචලා
03 ශ්‍රේණිය
ශා. මිඛායෙල් දහම් පාසල - නාලවාලන



**දිය ඇල්ලක්**
බ්‍රෝලින් ලුවිස් ප්‍රනාන්දු
06 ශ්‍රේණිය
ශා. ෆ්‍රැන්සිස් සේවියර් දහම් පාසල
සපුගස්කන්ද

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**මොස්තරයක්**
තරුෂිකා දෙව්මිණි
02 ශ්‍රේණිය
සුරදුතික බාලිකා මහා විද්‍යාලය
කුලියාපිටිය



**මාතර අප ස්වාමි දුව**
සඳලි රවීෂා සිරිවර්ධන
05 ශ්‍රේණිය
ශාන්ත මරියා දහම් පාසල - මාතර



# චතාරිකය තුළින් සැබෑ ජීවිත වෙනසක් කරා...

ආදර නංගියේ,
මල්ලියේ,

අළු බදාදා දිනෙන් ඇරඹි චතාරික සමයට අපි පිවිස ඇත්තෙමු. මෙය ජනවන්දනා වසරේ ඉතා වැදගත් වරප්‍රසාදයන්ගෙන් පරිපූර්ණ කලපරිච්ඡේදයකි. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය, ශ්‍රී මරණය හා උත්ථානය යන තෙවැදෑරුම් සිද්ධීන් හා වෙලුනු පාස්කු අභිරහස ගැඹුරින් සමරන්නට අපව යොමු කරවයි.

මෙම චතාරික සමය කිතුනුවන් වන අපට ආරාධනා කරනුයේ අපගේ පාපිබව පිළිගෙන මනස්ථාපනය වී ධර්මානුකූල දිවියක් ගත කිරීමටය.

චතාරික සමයේ ජනවන්දනා වත් පිළිවෙත් ද භක්ති අභ්‍යාසද පශ්චත්තාපික ක්‍රියා සියල්ල ද ජේසු සමිඳුන්ගේ දින 40 ක පාළුකරයේ අත් දැකීමට හවුල් වෙමින් අප තුළ ඇති අයහපත් ගති පැවැතුම්හා සිතුවිලිවලින් මිදී දේව වරප්‍රසාදයෙන් පිරුණු නව උත්ථානයක් අත්දැකීමට අපට ආරාධනා කරයි.

ඔබට මතකනම්, අළු බදාදා දිව්‍ය පූජාවේ පළමු කියවීම පශ්චත්තාපයට අපට ඇරයුම් කළා "උපවාසයෙන්ද, ස්ථිරත්වයෙන්ද, මුළු සිතින් දැන්වත් මා වෙත හැරී එන්න. වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. මන්ද එතුමාණෝ කරුණා හරිත දයාන්විත වහා නොකිපෙන තිර පෙමින් සමන්විත කමා වීමට කැමති දෙවි කෙනෙකි. (ජොවෙල් 2:12-13)



චතාරිකයේ පාපය නිසා කිලිටි වී අදුරු වී සිටින අපි අප අතින් වූ සිදු වූ පාපයන් ගැන සැබෑ ලෙස මෙනෙහි කර පසුතැවිලි වීමට උචිත කාලයකි.

මෙම පශ්චත්තාපික කාල පරිච්ඡේදයේදී වෙනදාට වඩා වැඩියෙන් යාච්ඤා කිරීම, පාද නමස්කාරය, ශුද්ධ වූ පැය, පසන්, ලතෝනි, ජපමාලය ආදී භක්ති අභ්‍යාසවල නිරත වීම දිව්‍ය පූජාවට සහභාගී වීම දේව වචනය කියවා මෙනෙහි කිරීම ආදිය අපගේ අධ්‍යාත්මික පාරිශුද්ධියට ඉවහල් වේ.

මෙම ක්‍රියාවන් හුදෙක් පුරුද්දක් පමණක් සීමා කර නොගෙන එයින් අරුත්බර දෙයක් ජීවිතයට එකතු කර ගැනීමට උත්සහ කරමු.

අපට හැකි පමණින් සත්‍යවශයෙන්ම වරුවක් කෑමෙන් වැලකි එක්වරුශිලය රකිමින් එම කෑම වෙල අසරණ කෙනෙක් වෙනුවෙන් ලබා දෙන්නට පියවර ගනිමු. මර්දන ක්‍රියා තුළින් අපගේ අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කර ගන්නට උත්සහ කරමු. ඒ සඳහා අපට කරන්නට හැකි දේ බොහෝමයක් ඇත. බොරු කීමෙන් අන් අයගේ සිත රිදවීමෙන්, නරක වචන භාවිතයෙන් වැලකී එමෙන්ම රූපවාහිනියේ බැලීමට ආසා වැඩ සටහන් නැරඹීමට යොමු නොවී එය සීමා කර ඒ වෙනුවට යාච්ඤා කිරීම, ආදි ක්‍රියා තුළින් අපට ජීවිතයේ නව පාස්කුවක්, එතෙරවීමක් අත් දකින්නට අප උත්සහ කරමු.

**විශ්මා ප්‍රියාංජලී**
**යටියන**

# මිලින වූ බලාපොරොත්තු



මලානික හිරු අවරගිරෙන්
බැස ගිය පාළු සන්දෑවේ
විහඟුන් ගැයු ගී
සවනතට දැනුණේ
ශෝකී වූ ගී රාවයකි
සිතේ රැව් දෙන්නේ
කියාගත නොහැකි වූ සන්තාපයකි
නෙතු නොපියා පහන් කළේ
ඔබ දැන් මඟ එතැයි යන
පහන් හදකිනි
නමුද මැදියම් රැය
මා දෙසවනට එක් කළේ
ඔබ සඳහටම නෙතු පියාගත් බව
මගේ පියාණෙනි.......

**එරන්දි පවිත්‍රා මල්ෂානි**
**2011 සා/පෙළ**
**සියලු සාන්තුවරයන්ගේ බා.වි. බොරැල්ල**

# කුරුණෑගල ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ හොඳම සිසුවිය ....

කුරුණෑගල ශුද්ධවූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදනෝත්සවය වයඹ පලාත් අධ්‍යාපන දෙපාර්තමෙන්තුමේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂිකා එන්.එච්. ප්‍රේමාවති මහත්මියගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණි. විශේෂ අමුත්තා ලෙස සහභාගි වුයේ විද්‍යාලයීය ආදි ශිෂ්‍යාවක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මූල්‍ය හා කළමනාකරණය පීඨයේ කථිකාචාර්යවරිය වන පී.ඒ එන්.එස්. අනුරාධා මෙනෙවියයි.

විදුහල්පති ගරු ශ්‍රියානි රෝඩ්රිගෝ පැවැදි සොයුරියගේ නායකත්වය හා මඟපෙන්වීම මත ඉතා සාර්ථකව පවත්වන ලද ත්‍යාග ප්‍රදනෝත්සවයේ හොඳම ශිෂ්‍යාව ලෙස දියුණි නුවංතික අබේසිංහ සිසුවිය ත්‍යාග ලබා ගන්නා අවස්ථාව ජායා රූපයෙහි දැක්වේ.

බර්තා පියුමි රොඩ්රිගෝ



## ස්වාධීන රූපවාහිනියේ 'සුදත් මඟ' කිතුනු වැඩසටහනට හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (ස්වදේශි සේවය) "කිතුනු ළමා හමුව" ට නිර්මාණ යොමුකරන්නට ළමා ඔබටත් අවස්ථාවක් !

**ළමා ඔබගේ නිර්මාණයන්** ඔබේ නම, ශ්‍රේණිය, පාසල, දහම් පාසල, දුරකතන අංකය ඔබ අයත් මීසම, පදවිය ආදි තොරතුරුද ඇතුලත් කර **පහත ලිපිනයට යොමු කරන්න.**

**ළමා ප්‍රදීපය "සුදත් මඟ"**
**ළමා නිර්මාණ අංශය**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08.**

**"කිතුනු ළමා හමුව"**
**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව**
**කොළඹ 07.**

සංස්කාරක පියතුමා

## ලොව ගැලවූ මිදුම්කරුවාණෝ..

ඒදන් උයනේදී මිනිසා පව් කෙරුවා
ඒ පව් වලට ඔහු දඬුවම් ලැබුවා
කරුණා නෙතින් ලොව දෙස නෙත් දල්වා
සිය පුතු ලොව ගලවා ගන්නට එව්වා

බෙත්ලෙහෙමේ ගව මඩුවකදී උපන්නේ
කල්වාරියේ කුරුසිය මත දිවි දුන්නේ
ජේසු සමිඳු ලොව ගලවා දුන්නේ
දෙව්පිය කැමැත්ත ඉටු කරලමින්නේ

එතුමන් එදා විඳි දුක් අද සිහි කරලා
බැතියෙන් කුරුසිය පා මුල වැඳ වැටිලා
ආදරයයි ප්‍රිතියයි අප මුසු කරලා
ගෞරව කරනෙමු අපි එතුමණන් දණ නමලා

සඳලි කවින්ද්‍යා පෙරේරා
09 ශ්‍රේණිය
ශා. ලෝරන්ස් කන්‍යාරාමය - වැල්ලවත්ත

## ධර්මදූත ළමා සමාජිකයිනට මෙන්න අනගි අවස්ථාවක් !

**ශ්‍රී ලංකාවේ ධර්මදූත ළමා සමාජයේ 25වෙනි සංවත්සරය නිමිති කරගෙන නිර්මාණය කිරීමට අපේක්ෂා කරන සංයුක්ත තැටියට ළමා ගීත (ගීතිකා නොවේ) රචනා කිරීමට ධර්මදූත ළමා සමාජ ළමුන්ට හා සජීවක සජීවිකාවන්ට කෙරෙන සුහද ආරාධනයට ඔබෙන් ලැබු ප්‍රතිචාරය මදිවු බැවින් එහි අවසන් දිනය තව රටත් දීර්ඝ කරන ලදි. ඔබගේ තලෙන්තු උරගා බැලීමට මෙය නියම අවස්ථාවක් බැවින් එය පැහැර නොහැර අදම ලියන්න !**

**තේමාව : "දේව රාජ්‍යය ගොඩනැගීම සඳහා මිනිස් වටිනාකම් ඉස්මතු කෙරෙන ගීතයන්"**

**පුන ගැයිය : (Chorus) සහ**

**ගැයිය දෙකක් (2 verses)**

**ඔබගේ නිර්මාණය සමඟ පහත කූපනයද පුරවා 2012 අප්‍රේල් මස 15 වෙනිදාට පෙර අප වෙත එවන්න.**

නම:- ..................................................................

ලිපිනය :- ..........................................................

ධර්මදූත ළමා සමාජ
ඒකකයේ නම :- ..................................................


මීසම :- ..............................................................

පදවිය :- ............................................................

මීසම් භාර පියතුමාගේ නම,
අත්සන හා නිලමුද්‍රාව :- .......................................

**අපගේ ලිපිනය :**
**ජාතික අධ්‍යක්ෂ පියතුමා**
**ශුද්ධාසනීය ධර්මදූත ළමා සමාජය**
**නො : 19, බැල්කම් පෙදෙස,**
**කොළඹ - 08.**
**දුරකථන අංකය : 011-2685673**

## ප්‍රහේලිකා අංක 29



### හරහට

1. අධෛර්යවත් නොවී නොකඩවා යාච්ඤා කළයුතු බව දක්වන පිණිස ක්‍රිස්තුන් වහන්සේ, ........ හා විනිශ්චකාරයා පිළිබඳ උපමාව වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය
4. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වීමට පෙර මධ්‍යහන වේලාවේදී රටපුරා අන්ධකාරයක් පහළ වී එය ..... තුන දක්වා පැතිරුණු බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය
5. ක්‍රිස්තුන් වහන්සේ ඇණ ගසන ලද කුරුසිය මුදුනේ ''ජුදෙව්වරුන්ගේ ....... මොහුය'' කියා ලියන ලද පුවරුවක් එල්ලා තිබිනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. යම් මිනිසෙකුගේ මෙය තුළින් ඔහුව හඳුනාගත හැකි අයුරු උපදේශකයා හෙවත් සිරාක් විස්තර කරයි.
9. ක්‍රිස්තුන් වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක ඇණ ගසා තිබු තැන්වල ඇඟිල්ල තබා බලනතුරු ක්‍රිස්තු උත්ථානය මෙසේ කිරීමට තෝමස් ශ්‍රාවකයා මැලිවිය.

### පහළට

1. අහසින් වැටෙන හිම හා වසින ..... නැවත හැරී නොගොස් පොළොව සරුසාරකර මිනිසාට ආහාර දෙනසේ දේව වචනය හිස්ව හැරී නොගොස් අදහස් ඉටුකරන බව යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. හිස්තැනට සුදුසු වචනය
2. පුප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යේ රොටී අනුබව කල පුරුෂයින් පමණක් පන් ...... වු බව ශු. බයිබලයේ සඳහාන් වෙයි. හිස්තැනට සුදුසු වචනය.
3. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රථම ප්‍රාතිහාර්යේදී උන්වහන්සේ මේවා වයින් බවට හැරවු සේක.

06. ...... හා මරණය සිහිකර විශ්වාසවන්ත ලෙස පණත් ඉටු කරන්නැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. හිස්තැනට සුදුසු වචනය

07. ක්‍රිස්තුන් වහන්සේගේ වචනය අසා පිළිපදින අය .....ශක්තිමත් අත්තිවාරමක් මත ගෙයක් ගොඩනැගූ මිනිසෙකුට සමාන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

08. ක්‍රිස්තුන් වහන්සේ ඇණ ගැසීමට පෙර මේවා වලින් පහරදුන් බව ශු. බයිබලයේ සඳහන් වේ.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලුක් 18,23,7, පරිච්ඡේද ශු. මාක් 6, ශු. ජුවාම් 2,20, යෙසායා 55 උපදේශකයා හෙවත් සිරාක් 28, 27/4-7)**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

අද සිට ඇරඹෙන අළුත්ම දිවැසිවර චරිත කතාව

# දිවැසිවර එලියා

සැකසුම : තිළිණ අලහකෝන්

දෙවන කොටස

